සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**මධ්‍ය වාර පරීක්ෂණය 2015**

**08 ශ්‍රේණිය**

# පෙරදිග සංගීතය

**කාලය පැය 2 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

**I කොටස**

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 ශුද්ධ ස්වර පමණක් යෙදෙන ආරෝහණ අවරෝහණයේ ස්වර 5 බැගින් යෙදෙන රාගය වන්නේ,

(1) බිලාවල් (2) කාෆි (3) භූපාලි (4) ඛ්‍යාල්

02 ග රි ග රි | ස රි ස ධ̣ | - ස - රි | ග - - - යනුවෙන් මුල් ගී පාදය යෙදෙන රාගය

(1) භූපාලි (2) කාෆි (3) බිලාවල් (4) යමන්

03 ඉහත ස්වර පාදය ප්‍රස්තාර වී ඇති තාලය වන්නේ,

(1) දාදරා (2) මැදුම් තනි තිත (3) ත්‍රිතාලය (4) මහ තනි තිත

04 මාත්‍රා කිහිපයක් එක්වීමෙන්

(1) තාලයක් සෑදේ (2) ආවර්තයක් සෑදේ

(3) අනුතාල සෑදේ (4) විභාගයක් සෑදේ

05 පහත සඳහන් භාණ්ඩ අතරින් සමාන ස්වර පිහිටීමක් ඇති භාණ්ඩ යුගලය වන්නේ,

(1) වයලීනය - එස්රාජය (2) සිතාරය - එස්රාජය

(3) සිතාරය - බටනලාව (4) වයලීනය - බටනලාව

06 දස අත විහිදෙන රුවන් වළාවන් යන ගීතය හා සම්බන්ධ රාගය වන්නේ,

(1) කාෆි (2) බිලාවල් (3) භූපාලි (4) යමන්

07 දො ං ජි | ජි ග ත යනු

(1) මහ තනි තිතයි. (2) සුළු තනි තිතයි.

(3) දාදරා තාලයයි. (4) මැදුම් තනි තිතයි.

08 එස්රාජය ප්‍රධාන වශයෙන් යොදාගැනෙන ඉන්දීය ගායන විශේෂය

(1) වංග (2) ඛ්‍යාල් (3) කර්ණාටක සංගීතය (4) රාග

09 ගාන්ධාරය සංවාදී වන අතර බිලාවල් රාගයේ වාදී ධෛවතය වේ.

(1) වාදී ධෛවතය වුවත් සංවාදී ස්වරය වැරදිය. (2) වාදී සංවාදී ස්වර නිවැරදිය.

(3) වාදී සංවාදී ස්වර නිවැරදි නැත. (4) සංවාදී ස්වර වැරදිය.

10 ස්වර පුවරුවේ ඇති කළු පාට යතුරු වලින්

(1) ශුද්ධ ස්වර දක්වේ. (2) තීව්‍ර ස්වර දක්වේ.

(3) කෝමල ස්වර දක්වේ. (4) විකෘති ස්වර දක්වේ.

- **අංක 11 - 15 දක්වා වූ ප්‍රශ්න නිවැරදි ලෙස යාකරන්න.**

11 ලෝක ප්‍රසිද්ධ සිතාර් වාදකයෙකි. (a) තබ්ලාව

12 පෙර අපර දෙදිග භාවිතා වන වාද්‍ය භාණ්ඩයකි (ස්වර) (b) සර්ගම්

13 ස්වර වලින් පමණක් නිර්මිත රාගධාරී ගීතයකි. (c) ඩබ්. ඩී. අමරදේව මහතා

14 අමීර් ඛුෂ්රු විසින් නිර්මාණය කරන ලද සංගීත භාණ්ඩයකි. (d) රවි ශංකර්

15 රත්න දීප ජන්ම භූමි ගීතය ගායනා කරන්නේ (e) වයලීනය

● **වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16 වන්නමක මුලින්ම ගයනු ලබන්නේ,

(1) කවියයි. (2) තානමයි. (3) අඩව්වයි. (4) බෙරපදයයි.

17 රාග ඇතුළත් ගායන විශේෂය වන්නේ,

(1) මධ්‍යලය ගී (2) භජන් ගී (3) සර්ගම් (4) ඛ්‍යාල්

18 තාලයක ප්‍රබල ස්ථානය හඳුන්වනු ලබන්නේ,

(1) සමග්‍රහයයි. (2) බලයයි. (3) විභාගයි. (4) ආවර්තයි.

19 Introduction, Verse, Interlude, Chorus මෙහි සඳහන්ව ඇත්තේ සරල ගීතයක ඇති ආකෘතියයි. ඉන් අතුරු වාදන කොටස හඳුන්වනු ලබන්නේ,

(1) Introduction (2) Verse (3) Interlude (4) Chorus

20 හින්දුස්ථානි සංගීතයේ ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය වන්නේ,

(1) ගැටබෙරයයි. (2) තබ්ලාවයි. (3) ඩොල්කියයි. (4) කොංගෝ ඩ්‍රම්ස්

(2 x 20 = 40)

## II කොටස

● **තෝරාගත් ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

01 (1) මධ්‍යමය හා ෂඩ්ජය වාදි සංවාදී වන රාගයක මධ්‍යලය ගීතයේ ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල . 06)

(2) එම රාගයේ රාග විස්තර ලියා දක්වන්න. (ආරෝහණ, අවරෝහණ, ගානසමය, ජාතිය, මුඛ්‍යාංගය) (ල . 06)

02 (1) සම් ස්ථානය ( ), බලි ස්ථානය පමණක් යොදන හින්දුස්ථානි තාල දෙකක් නම් කරන්න. (ල . 04)

(2) ඉන් එක් තාලයක් තාල මූලධර්ම සහිතව ප්‍රස්තාර කරන්න. (ල . 04)

(3) මාත්‍රා 3 න් 3 ට මාත්‍රා කැටිවන දේශීය තිත නම් කර එය ප්‍රස්තාර කරන්න. (ල. 04)

03 (1) ඔබ උගත් තත් වාද්‍ය භාණ්ඩයක රූප සටහනක් ඇඳ කොටස් 5 ක් ලකුණු කරන්න. (ල. 08)

(2) එම භාණ්ඩයේ විශේෂ ලක්ෂණ 4 ක් සඳහන් කරන්න. (ල . 04)

04 (1) රසවින්දනයට සුදුසු ඔබ උගත් සරල ගීත 4 ක් ලියා දක්වා එම ගීතයේ ගායකයා හෝ ගායිකාවගේ නම ඉදිරියෙන් සඳහන් කරන්න. (ල . 06)

(2) ඔබ දන්නා සරල ගීතයක ස්වර ප්‍රස්තාරය ලියා දක්වා එම සරල ගීතයේ කොටස් නම් කරන්න. (ල . 06)

05 (1) උඩරට වන්නමකට අයත් කොටස් ලියා දක්වන්න. (ල .